**ජෝන් ද මැල් ශත සංවත්සර ජන්ම දින උපහාර**

ශ්‍රී ලංකා සුමිත්‍රයෝ නිර්මාතෘ අප ආදරණීය ජෝන් ද මැල්ගේ ශත සංවත්සර ජන්ම දිනය 2021 අප්‍රේල් මස 21 වනදාට යෙදී ඇත. ඇගෙන් ලද දැනමුතුකම්, සමාජ පරිවර්තනයක් සඳහා ඇය දැක්වූ පරහිතකාමී ලැදියාව නිරන්තරයෙන් අපට අනුප්‍රාණය සැපයූ බව නොරහසකි. සිය දියණිය 'පෙනී' හා පුතණුවන් 'නික්' මෙලොව තනි කරමින් 2008 දෙසැම්බර් 27 වන දින ඇගේ ආත්මය මෙලොවින් එපිට ප්‍රීතිමත් ලෝතලයන් තුළ නිදහසේ සැරිසැරුවද ශ්‍රී ලාංකීය ප්‍රජාව වෙත ඇය දැක්වූ ආදර සැලකිලි සුමිත්‍රයෝ චිත්තවේග සහය සේවා හරහා එය අවැසි වූවන් වෙත ලබාදීම තුළින් අද දක්වා පවත්වා ගෙනයයි. ඇය ලබාදුන් විචිත්‍රවත් ආදර්ශය නිරතුරු අප තුළ අනුනාද වේ.

බ්‍රිතාන්‍ය පුරවැසියෙකු වූ ජෝන් ද මැල් 1971 වසරේ ශ්‍රී ලංකාවට පැමිණ ලක්දාස ද මැල් නම් බිෂොප්වරයා හා විවාපත් විය. ඇගේ ස්වාමි පුරුෂයාගේ විසල් පවුලත්, උණුසුම් හදවත් හිමි සිය ශ්‍රී ලාංකීය මිතුරු කැලත් නිසාම එතැන් පටන් ශ්‍රී ලංකාව ඇගේ නිවස්නය බවට පත්විය.

මේ අතර එවකට කොළඹ මහ රෝහලේ රාජකාරි කළ වෛද්‍යවරයෙකුට සිය වාට්ටුවේ එක් දිනක් තුල සිය දිවි තොර කර ගැනීමට උත්සාහ කළ පුද්ගලයින් සිව් දෙනෙකු මුණගැසුණි. එම වෛද්‍යවරයාගේ නියමය පරිදි සියදිවි හානිකර ගැනීම් වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා සුමිත්‍රයෝ ආයතනය පිහිටුවීමට ජෝන් නොපමාව කටයුතු කළාය. මේ සඳහා සිය සැමියාගෙන් මෙන්ම වෛද්‍ය විජේරාම, නාලිනි එල්ලාවල සහ මන්සූර් ගවුස් යන අයගෙන් සමන්විත කමිටුවෙන් ද ඇයට පූර්ණ සහයක් හිමිවිය. ඒ අනුව 1974 වර්ෂයේ ලොව පුරා පැතිරුණු බිෆ්‍රෙන්ඩර්ස් සංවිධානයේ ( Organization of Befrienders) ශාඛාවක් ලෙස කොළඹ ඕන්ස් පාරේ කාමර දෙකකින් ආරම්භ වූ සුමිත්‍රයෝ ආයතනය, පසුව ජෝන්ගේ ස්වාමිපුරුෂයාගේ පාරම්පරික දේපොලක් වූ කොළඹ 7 ස්ථානයට ගෙන එන ලදී.

මිනිස් දිවියේ සෑම පැතිකඩක්ම නියෝජනය කරන, ආදරණීය ලෙස තවත් අයෙකුට සැලකිලි දැක්විය හැකි ගැහැණු හා පිරිමි මෙහි වැටුප් නොලබන ස්වේච්ඡා සේවකයන් ලෙස තෝරා ගැනුණි. පීඩාවට පත්වූ අවස්ථාවකදී කෙනෙකුට සැලකිලි දැක්විය හැකි අයුරු ප්‍රකට කරන පුහුණුවක් ඔවුනට හිමි විය. දැඩි විනයධරයකු වූ ජෝන් දක්ෂ ලෙස ස්වේච්ඡා සේවකයින් පුහුණු කළාය. බලාපොරොත්තු විරහිත, විශාදයට පත්වූ මෙන්ම සියදිවි හානි කරගැනීමට තැත් කරන පුද්ගලයින්, චිත්තවේගමය වශයෙන් කැලඹුණු ස්වභාවයක් ඇති අයවලුන්, සිත් තැවුලෙන් පසුවන්නන් ආදී විවිධ ආකාරයේ ගැටළු ඇති පුද්ගලයින්ට චිත්තවේගමය සහය සැලසීමට ස්වේච්ඡා සේවකයින්ට මේ හරහා පන්නරය ලැබුණි.

ස්වේච්ඡා සේවකයාට මුණගැසෙන දුක්ට පත්වූ සේවාලාභියාගේ රහස්‍යභාවය පූර්ණ වශයෙන් සුරැකෙන පරිදි ආයතනයේ ආචාර ධර්ම පද්ධතිය සකස් වී ඇත. සම්පූර්ණයෙන්ම නොමිලේ සැපයෙන මෙම සේවාව තුළ ස්වේච්ඡා සේවකයන්ට ආගම හෝ දේශපාලනය පිළිබඳව කතා කළ නොහැක. කිසි විටෙකත් සේවාලාභියා සදාචාරාත්මක විනිශ්චයකට බඳුන් නොකරමින් කිසිදු බැඳීමකට යටත් නොවී ස්වේච්ඡා සේවකයන් සිය සේවය සපයයි.

ජීවිතය සමග තවදුරටත් පොර බැදිය නොහැකි යැයි සිතන අයවළුන්ට ආදරය, කරුණාව හා සැලකිල්ල දැක්වීම සියලු රෝග නසන ඖෂධයක් වන්නේය. රහස්‍යභාවය හා නිර්ණාමිකත්වය සුරැකීම සේවාලාභියාට නිතැතින්ම අස්වැසිල්ලක් ලබාදීමට හේතුවේ. මේ සඳහා හිතමිතුරුකරණය (Befriending) නම් ක්‍රමය භාවිතා කරනු ලබයි. හිතමිතුරුකරණය (Befriending) යනු පීඩාවට පත් සේවාලාභියකු සමඟ හිඳිමින් ඔහුට/ඇයට චිත්තවේගයන් පිට කිරීමට දිරි දෙමින්, විනිශ්චය නොකරමින් ඔහු හෝ ඇයව පිළිගැනීම හරහා වැඩදායක ලෙස සවන්දීම මෙන්ම සහකම්පනය හා කරුණාව පෙරදැරි කරගෙන ප්‍රතිචාර දක්වමින් ගොඩනගාගන්නා හිතවත්කම හරහා සේවා ලාභියාට ඉහිල් වීමටත්, පවතින ආතති තත්වයෙන් යම්තාක් දුරකට මිදීමටත් සහය වීමයි. මෙවැනි අවස්ථාවක සහකම්පනයෙන් යුතුව සේවාලාභියා දෙස හෙලන බැල්මකින් පවා ඔහුට/ඇයට සහනයක් සැලසේ.

මෙසේ කතාබහක කරන අතරතුර සේවාලාභියා මෙතෙක් පැවැති ආතතීන්ගෙන් යම් සහනයක් ලබයි. ස්වේච්ඡා සේවකයා අඩුවෙන් කතා කරමින් තමා අසා සිටින කතාව තේරුම් ගත් බව හඟවමින් එම මොහොත තුළ පවතින ආතති තත්ත්වයෙන් සහනයක් ලබා ගැනීමට සේවාලාභියාට සහය වේ. මීළඟට එළඹෙන්නේ ස්වේච්ඡා සේවකයා සිය හඬ අවදි කරන මොහොතයි. සේවාලාභියාට පවතින ආසන්නතම පීඩා තත්වයන්ට සහනයක් සැලසීම සඳහා ඔහුගේ/ඇයගේ පවුලේ ස්වභාවය, ආර්ථික තත්තවය මත වඩාත් සරිලන විකල්ප පිළිබඳව කතාබහ කිරීම අරඹයි. ඇත්තෙන්ම මෙහිදී සිදුවනුයේ පුහුණුවූ, මිත්‍රශීලී, සහකම්පනයෙන් යුතු, විනිශ්චය

නොකරන, සේවාලාභියා මුහුණ පා ඇති අප්‍රසන්න තත්ත්වය පිළිගන්නා ස්වේච්ඡා සේවකයෙකු, පීඩාවට පත්ව අසතුටින් පසුවන අයෙකු සමඟ එක්ව තැබීමයි. මෙම ක්‍රමය තුළින් සේවාලාභියා තමා මුහුණපා ඇති තත්ත්වය, තමාට සරිලන ආකාරයට හසුරුවා ගැනීමට සවි බල ගැන්වේ. එනිසාම තම ජීවිතයේ නැවත වතාවක් චිත්තවේගමය වශයෙන් අසීරු තත්ත්වයක් ඇති වුවහොත් සහය සොයමින් සුමිත්‍රයෝ කරා යොමු වීමට බොහෝ සේවාලාභීන් පසුබට නොවේ.

අසතුටින් හා බලාපොරොත්තු විරහිතභාවයෙන් තොර සෞඛ්‍යමත් ජීවන රටාවක් ප්‍රවර්ධනය කිරීම සඳහා සුමිත්‍රයෝ ආයතනය විසින් 'මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමේ' වැඩසටහනක් දියත්කර ඇති අතර එය නො. 60, හෝර්ටන් පෙදෙස, කොළඹ 7 යන ස්ථානයේ පිහිටුවා ඇත.

සුමිත්‍රයෝ ආයතනය ඇමැතීම හරහා සමහර පුද්ගලයින් අද දක්වා ජීවත් වෙමින් සතුටින් කල්ගත කිරීම පිලිබඳව ජෝන් නිරතුරුවම තෘප්තිමත් විය. කෙසේ වුවත් සිය ස්වාමිපුරුෂයා වූ ලක්දාස ද මැල් බිෂොප්වරයාගේ වියෝවත් සමග ජෝන් දොම්නසින් සසල වී ගියාය. එමගින් ඇති වූ චිත්තවේගමය ආතතියෙන් මිදීමට ''Lakdasa De Mel: God's Servant, World Citizen's Son'' (දේවදාස, ජගත් පුරවැසියාගේ පුතණුවන් - ලක්දාස ද මැල්) නමින් ග්‍රන්ථයක් ලියා තැබුවාය. ඔහුට ගෞරව දැක්වීමට ඊට වඩා උචිත ග්‍රන්ථ නාමයක් තිබිය හැකිද? නැවතත් සිය දිවිය පෙර ලෙස පවත්වාගෙන යාමට මේ ග්‍රන්ථකරණය ඇය සවිබලගැන්වීය. කරදර බාධක රාශියක් මධ්‍යයේ සුමිත්‍රයෝ ආයතනය පිහිට වූ ආකාරය පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් වන ඇගේ දෙවන ග්‍රන්ථය ' Closer than the Brother' නම් විය.

ජෝන් කිසිදාක අප ආයතනයේ කළමනාකාරීත්වයට මැදිහත් නොවීය. මමංකාරයෙන් තොර පුද්ගලයෙකු වූ ඇය නිලතල, ප්‍රසිද්ධිය, බලය, තනතුරු පසුපස හඹා නොගොස් ඒ වෙනුවට මෙවැනි ආයතනයක් පිහිටුවා පසුව ප්‍රාදේශීය ශාඛා ද ඇති කරමින් මහඟු සේවයක් ඉටු කරන ලදී. මේ සියල්ල සිදු කරමින් තම අවසන් හුස්ම හෙළන තුරුම ඇය නිහතමානී ස්වේච්ඡා සේවකයෙකු ලෙස අප සමඟ කටයුතු කළාය. සුමිත්‍රයෝ ආයතනයේ නිර්මාතෘ තමා යැයි කියා කිසි විටකත් මානයක් ඇති නොකර ගත් ඇය ඉතා සරල ගති පැවතුම් ඇති කරුණා, දයා සම්ප්‍රයුක්ත අවස්ථානුකූලව අනුවර්තනය වූ කාන්තාවක් විය. එය පුද්ගලයෙකු තුළ ඉතා කලාතුරකින් දැකගත හැකි ලක්ෂණයක් බව සඳහන් කළ යුතුමය.

ජෝන් විසින් ආරම්භ කරන්නට යෙදුණු මෙම විශ්වාසනීය චිත්තවේග සහය සේවාව එදා සිට අද දක්වා වසරේ දින 365 තුළ ම උදෑසන 9 සිට රාත්‍රී 8 තෙක් නො. 60B, හෝර්ටන් පෙදෙස, කොළඹ 7 යන ස්ථානයේදී සිංහල, දමිළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම මුහුණට මුහුණ, ඊමේල් හා දුරකථන යන ක්‍රම ඔස්සේ නොමිලයේ ලබාගත හැක. විශ්වාසනීයත්වය ආරක්ෂා කිරීම සඳහා අප දුරකථන වල අමතන්නා ගේ අනන්‍යතාවය (Caller ID) අක්‍රිය කර ඇත.

ජෝන් මෙලොවින් වියෝ වන තුරුම නිර්ලෝභීව, මහත් ළැදියාවෙන් හා කැපවීමෙන් යුතුව පීඩාවට පත්වූවන්ට උපකාර කරමින් සුමිත්‍රයෝ ආයතනය අද පවතින තත්වයට ගෙන ඒමට මග පෙන්වූවාය. හෝර්ටන් පෙදෙසේ සුමිත්‍රයෝ මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ල ආයතනය වෙත නොමසුරුව පරිත්‍යාග කළාය. එහි ඇති ඇගේ නිවස සහ යාබද පරිශ්‍රය සුමිත්‍රයෝ සේවා සඳහා ලබා දී ඇත. සරල, පිවිතුරු දිවියක් ගත කළ ඇය තමා සතු සෑම ආදායමක්ම පාහේ පුණ්‍ය කටයුතු සඳහා ලබා දුන්නාය.

සුමිත්‍රයෝ ආයතනයේ නිර්මාතෘවරිය ලෙස ආදර්ශමත් ජීවිතයක් ගත කරමින්, මහඟු උරුමයක් අප වෙත ඉතිරි කර ගිය ජෝන් ද මැල් නම් ඒ උත්තරීතර කාන්තාවට සුමිත්‍රයෝ හි අප මෙන්ම අති මහත් ශ්‍රී ලාංකේය ප්‍රජාවත් සදා කෘතඥ වෙමු.

සුමිත්‍රයෝ

60 B, හෝර්ටන් පෙදෙස, කොළඹ 7

දුරකථන අංක: සුමිත්‍රයෝ 0112 - 696666, 0112 - 692909, 0112- 683555

මෙල් මැදුර: 0112- 694665, 0112- 693460

ඊ මේල්: sumithra@sumithrayo.org

වෙබ් අඩවිය: www.sumithrayo.org